# තනතුරු - ඇබෑර්තු

**රාජ්‍ය සේවා කොමිෂන් සභාව**

වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යාංශය

**වෙළඳ නාවික ලේකම් කාර්යාලය**

වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යාංශය යටතේ පවත්වාගෙන යනු ලබන වෙළඳ නාවික ලේකම් කාර්යාලයේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම් සපුරාලන ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| *තනතුර* | *පුරප්පාඩු සංඛ්‍යාව* |
|---|---|
| 01. අධ්‍යක්ෂ (නාවික) | 01 |
| 02. අධ්‍යක්ෂ (ඉංජිනේරු) | 01 |
| 03. වරාය රාජ්‍ය පාලන නිලධාරී (නැව් තට්ටු) | 01 |
| 04. වරාය රාජ්‍ය පාලන නිලධාරී (ඉංජිනේරු) | 02 |
| 05. විභාග පරීක්ෂක (ඉංජිනේරු) | 02 |

**වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යාංශයේ වෙළඳ නාවික ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂ (නාවික) තනතුර සඳහා බඳවා ගැනීම - 2022**

වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යාංශය යටතේ පවත්වාගෙන යනු ලබන වෙළඳ නාවික ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂ (නාවික) තනතුර සඳහා මෙහි දෙවන වගන්තියේ සඳහන් සුදුසුකම් සපුරාලන ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| තනතුර | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|
| 01. අධ්‍යක්ෂ (නාවික) | 01 |

1. *බඳවා ගැනීමේ ක්‍රමය :*

   මෙම නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් අතරින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත ඉහළම ලකුණු ලබා ගන්නා අපේක්ෂකයා, පුරප්පාඩුව සඳහා බඳවා ගනු ලැබේ. එහිදී යොදා ගනු ලබන රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ ලකුණු දීමේ පටිපාටිය මෙම නිවේදනයේ අංක 05 යටතේ දක්වා ඇත.

2. *අවශ්‍ය සුදුසුකම් :-*

   (i) අධ්‍යාපන සුදුසුකම්, පළපුරුද්ද හා වෙනත් සුදුසුකම් :

| *තනතුර* | *අධ්‍යාපන සුදුසුකම්* | *පළපුරුද්ද හා වෙනත් සුදුසුකම්* |
|---|---|---|
| අධ්‍යක්ෂ (නාවික) | ශ්‍රී ලංකාව හෝ එක්සත් රාජධානිය හෝ ඕස්ට්‍රේලියාව හෝ කැනඩාව හෝ චීනය හෝ ඉන්දියාව හෝ පකිස්ථානය හෝ නවසීලන්තය හෝ මලයාසියාව හෝ සිංගප්පූරුව හෝ දකුණු අප්‍රිකාව හෝ අයර්ලන්තය යන රටවල හෝ අදාළ සහතික පිළිගැනීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව සමඟ ද්විපාර්ශික ගිවිසුම්වලට එළඹ ඇති රටක රාජ්‍ය නාවික පරිපාලන ආයතනයක් විසින් නිකුත් කරනු ලැබූ නැව්පති ප්‍රවීණතා සහතිකය ලබා තිබීම. | තනි බර ටොන් 3000ක හෝ ඊට වැඩි සාගර/සමුද්‍රීය තරණයෙහි යෙදෙන වෙළඳ නෞකාවක නැව්පති වශයෙන් අවුරුදු 02 ක අවම පළපුරුද්දක් තිබීම. |

(ii) කායික සුදුසුකම් :
සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරෙහි රාජකාරී ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය.

(iii) වයස් සීමාව :
ඉල්ලුම්කරුවන් ඉල්ලුම් පත්‍ර භාර ගැනීමේ අවසාන දිනට වයස අවුරුදු 30ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 45ට නොවැඩි විය යුතු ය.

දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු අයට වයස් සීමාව බල නොපානු ඇත.

(iv) වෙනත් සුදුසුකම් :

- ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු ය.
- අයදුම්කරු විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.

*සටහන* :- අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට අයදුම්කරුවන් විසින් ඉහත සියලු සුදුසුකම් සෑම ආකාරයකින් ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

3. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි හා සේවා කොන්දේසි :-

(i) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයට ඔබ යටත් විය යුතුවේ. ඔබ වැන්දඹු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතු අතර රජය මගින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතු ය.
(ii) මෙම පත්වීම අවුරුදු තුනක පරිවාස කාලයකට යටත්ය. මෙම තනතුරෙහි I වැනි ශ්‍රේණියට බඳවාගෙන වසර 05 ක් ඇතුළත බඳවා ගැනීමේ පරිපාටියේ සඳහන් ආකාරයට පළමු වැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතු ය.
(iii) 2020.10.16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 හි සඳහන් විධිවිධාන අනුව අදාළ රාජ්‍ය භාෂාවේ/භාෂාවන්හි ප්‍රවීණතාවය ලබා ගත යුතු ය.
(iv) මෙම පත්වීම රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති වලට ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද, රජයේ මුදල් රෙගුලාසිවලටද, දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝග හා චරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යාංශයේ වෙළඳ නාවික ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂ (නාවික) තනතුරට අදාළ බඳවා ගැනීමේ පරිපාටියට දැනටමත් කර ඇත්තා වූද, මතුවට කරනු ලබන්නා වූද, සංශෝධනයන්ට හා විධිවිධානයන්ට යටත් වේ.
(v) අයදුම් කරන භාෂා මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩ ලබා නොදෙන අතර, අයදුම්පත්‍රයේ සඳහන් කරනු ලබන භාෂා මාධ්‍ය පත්වීම් ලැබීමට සුදුසුකම් ලබන භාෂා මාධ්‍ය වේ.

4. *වැටුප් පරිමාණය :-*

මෙම තනතුරට රු.47,615 -10 x 1,335 - 8 x 1,630 - 17 x 2,170 - රු. 110,895 ක (මාසික) වැටුප් පරිමාණයක් හිමි වන අතර මෙහි 20 වන පියවරෙහි (රු.76,175) තබා වැටුප් ගෙවනු ලැබේ. (මීට අමතරව රු. 85,000 ක වෘත්තීය දීමනාවක් ඇතුලු රජය විසින් අනුමත අනෙකුත් දීමනා හා වරප්‍රසාද මෙම තනතුරට හිමිය.)

5. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා පහත සඳහන් ලකුණු පටිපාටිය පදනම් කරගනු ලැබේ.

| *අනු අංකය* | *විෂය* | *ලකුණු* | *උපරිම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|
| 01 | අතිරේක අධ්‍යාපන සුදුසුකම<br>i. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින්/ආයතනයකින් ලබා ගත් නාවුක විද්‍යාව, නෞකා යාත්‍රණ හා සාමුද්‍රීය විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධියක් සඳහා<br>ii. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින්/ආයතනයකින් ලබා ගත් නාවුක විද්‍යාව, නෞකා යාත්‍රණ හා සාමුද්‍රීය විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් සඳහා<br>iii. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින්/ආයතනයකින් ලබා ගත් සමුද්‍රීය ඉංජිනේරු විද්‍යාව, නාවුක විද්‍යාව, නෞකා යාත්‍රණ හා සාමුද්‍රීය විද්‍යාව පිළිබඳ උපාධියක් සඳහා<br>(උපරිම සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ.) | 30<br><br>20<br><br>15 | 30 |

| අනු අංකය | විෂය | ලකුණු | උපරිම ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| 02. | වෘත්තීය සුදුසුකම්<br>සමුද්‍රීය සෝදිසි කිරීම, සාමුද්‍රික නීතිය හා රෙගුලාසි, සාමුද්‍රීය පරීක්ෂණ හා විමර්ශන හෝ නාවික කටයුතු ආරක්ෂාව සහ සුරක්ෂිතතාවය පිළිබඳ ජාත්‍යන්තර ප්‍රමිතීන් යන ක්ෂේත්‍රයන්ට අදාළව රජය පිළිගත් ආයතනයකින් ලබාගත්<br>i. මාස 06 ක හෝ ඊට වැඩි පූර්ණ කාලීන හෝ ඊට සමාන අධ්‍යයන කාලයක් සහිත පාඨමාලා<br>ii. මාස 03 ක් හෝ ඊට වැඩි හා මාස 06 ට අඩු පූර්ණ කාලීන හෝ ඊට සමාන අධ්‍යයන කාලයක් සහිත පාඨමාලා<br>iii. මාස 03 ට අඩු පූර්ණ කාලීන හෝ ඊට සමාන අධ්‍යයන කාලයක් සහිත පාඨමාලා (උපරිම සහතික 02 ක් සඳහා ලකුණු ලබා දිය හැක.) | 10<br>07<br>03 | 10 |
| 03. | අතිරේක පළපුරුද්ද<br>i. රාජ්‍ය නාවික පරිපාලන ආයතනයක විධායක හෝ ජ්‍යෝෂ්ඨ කළමනාකරණ මට්ටමක තනතුරක සේවය කර තිබීම.<br>- එක් වසරකට ලකුණු 04 බැගින් උපරිමය වසර 05ක් සඳහා<br>- මාස 06 ට වැඩි හා අවුරුද්දකට අඩු : ලකුණු 02<br>ii. බඳවා ගැනීමේ සුදුසුකම් යටතේ සඳහන් අවම පළපුරුද්ද ඉක්මවූ පළපුරුදු කාලසීමාව වෙනුවෙන්<br>- එක් වසරකට ලකුණු 02 බැගින් උපරිමය වසර 05ක් සඳහා<br>- මාස 06ට වැඩි හා අවුරුද්දකට අඩු : ලකුණු 01 | 20<br>10 | 30 |
| 04 | ක්ෂේත්‍රය සඳහා දායකත්වය<br>ක්ෂේත්‍රයට අදාළව ජාතික හෝ ජාත්‍යන්තරව පිළිගත් ශාස්ත්‍රීය සංග්‍රහයක පළ වූ පත්‍රිකාවක් හෝ පේටන්ට් අයිතිය සහිත නව සොයා ගැනීම් විධිමත්/පිළිගත් අනුමැතියන් හෝ සහතික ඉදිරිපත් කළ යුතු ය | 10 | 10 |
| 05 | පරිගණක හැකියාව<br>සාමුද්‍රික ඉංජිනේරු විද්‍යාව, නෞකා යාත්‍රණ, නාවික/සාමුද්‍රීය විද්‍යාව හෝ පරිගණක ආශ්‍රිත පුහුණු කිරීම්, හා පරීක්ෂණ පැවැත්වීම යන ක්ෂේත්‍රයන්ට අදාළ තොරතුරු තාක්ෂණය/පරිගණක පද්ධති හා පරිගණක යෙදවුම් පිළිබඳ රජය පිළිගත් ආයතනයකින් ලබාගත්<br>i. මාස 06 ක හෝ ඊට වැඩි පූර්ණ කාලීන හෝ ඊට සමාන අධ්‍යයන කාලයක් සහිත පාඨමාලා<br>ii. මාස 03 ක හෝ ඊට වැඩි හා මාස 06 ට අඩු පූර්ණ කාලීන හෝ ඊට සමාන අධ්‍යයන කාලයක් සහිත පාඨමාලා<br>iii. මාස 03 ට අඩු පූර්ණ කාලීන හෝ ඊට සමාන අධ්‍යයන කාලයක් සහිත පාඨමාලා (උපරිම සහතික 02 ක් සඳහා ලකුණු ලබා දිය හැක) | 15<br>10<br>03 | 15 |
| 06 | සම්මුඛ පරීක්ෂණයේ දී පෙන්වනු ලබන කුසලතාවය සඳහා | | 05 |
| | එකතුව | | 100 |

6. අපේක්ෂකයින්ගේ අනන්‍යතාවය :-

i. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන්නේ සෑම ආකාරයකින් ම සම්පූර්ණ කරන ලද අයදුම්පත් ඉදිරිපත් කර ඇති අපේක්ෂකයින් පමණි.
ii. සම්මුඛ පරීක්ෂණයේදී සියලුම සහතික වල මුල් පිටපත් හා නිසි පරිදි සහතික කරන ලද ඡායා පිටපත් ඉදිරිපත් කළ යුතුය.
iii. සම්මුඛ පරීක්ෂණයේදී තමන්ගේ අනන්‍යතාවය සහතික කිරීම සඳහා පහත සඳහන් අනන්‍යතා පත්‍ර පිළිගනු ලැබේ.

(a) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද වලංගු ජාතික හැඳුනුම්පත;
(b) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

7. අයදුම්පත් ඉදිරිපත් කිරීම :-

(i) අයදුම්පත් **2022 ඔක්තෝබර් මස 01 වැනි දිනට** හෝ ඊට ප්‍රථම පහත සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කළ යුතු වේ. එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

වෙළඳ නැව් අධ්‍යක්ෂ ජනරාල්,
වෙළඳ නාවික ලේකම් කාර්යාලය,
අංක 43/89, බ්‍රිස්ටල් ගොඩනැගිල්ල,
1 වන මහල, යෝර්ක් වීදිය, කොළඹ 01.

(ii) ඉදිරිපත් කළ යුතු අයදුම්පත්‍රයේ ආදර්ශ ආකෘති පත්‍රයක් මෙම නිවේදනය අවසානයේ දක්වේ. අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත් A4 ප්‍රමාණයේ කඩදාසියක සකස් කර මුල් පිටුව අංක 01 සිට 09 දක්වාත් දෙවැනි පිටුව අංක 10 සිට 15 දක්වාත්, වන ආකාරයෙන් පිළියෙල කර තමාගේ අත් අකුරින් සම්පූර්ණ කළ යුතුය.

(iii) අයදුම්පත බහාලන කවරයේ ඉහළ වම් කෙළවරේ ''අධ්‍යක්ෂ (නාවික) තනතුර සඳහා අයදුම් කිරීම'' යනුවෙන් සඳහන් කළ යුතුය.

(iv) අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ පාසලක විදුහල්පතිවරයෙකු/සාමදාන විනිශ්චයකාරවරයෙකු/දිවුරුම් කොමසාරිස්වරයෙකු/නීතීඥවරයෙකු/ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු/ත්‍රිවිධ හමුදාවේ අධිකාරීලත් නිලධරයෙකු හෝ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 ට අනුව, රු. 32,807 ක් හෝ ඊට වැඩි මාසික වැටුපක් ලබන රජයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු විසින් සහතික කළ යුතුය.

(v) දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් තම අයදුම්පත්, තමන් සේවය කරන දෙපාර්තමේන්තුවේ දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් ඉදිරිපත් කළ යුතුය.

(vi) මේ සමඟ ඇති ආදර්ශ අයදුම්පත්‍රයේ ආකෘතියට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් නැතිවීම හෝ ප්‍රමාද වීම ගැන කිසිදු පැමිණිල්ලක් භාර ගනු නොලැබේ.

8. ඔබ විසින් එවන ලද අයදුම්පත්‍රයේ සඳහන් කර ඇති යම් තොරතුරක් අසත්‍ය බව හෝ වැරදි බව බඳවා ගැනීමට ප්‍රථම අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදාළ ක්‍රියා මාර්ගයන්ට යටත්ව සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

9. පුරප්පාඩු පිරවීමේ හෝ නොපිරවීමේ අයිතිය රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

කේ. ඩී. එස්. රුවන්චන්ද්‍ර,
ලේකම්,
වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යාංශය.

2022 අගෝස්තු මස 22 වැනි දින,
වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යාංශය,
අංක 19,
චෛත්‍ය පාර,
කොළඹ 01.

**වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යාංශයේ වෙළඳ නාවික ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂ (ඉංජිනේරු) තනතුර සඳහා බඳවා ගැනීම - 2022**

වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යාංශය යටතේ පවත්වාගෙන යනු ලබන වෙළඳ නාවික ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂ (ඉංජිනේරු) තනතුර සඳහා මෙහි දෙවැනි වගන්තියේ සඳහන් සුදුසුකම් සපුරාලන ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| තනතුර | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|
| 01. අධ්‍යක්ෂ (ඉංජිනේරු) | 01 |

1. බඳවා ගැනීමේ ක්‍රමය ඃ

මෙම නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් අතරින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත ඉහළම ලකුණු ලබා ගන්නා අපේක්ෂකයා, පුරප්පාඩුව සඳහා බඳවා ගනු ලැබේ. එහිදී යොදා ගනු ලබන රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ ලකුණු දීමේ පටිපාටිය මෙම නිවේදනයේ අංක 05 යටතේ දක්වා ඇත.

2. අවශ්‍ය සුදුසුකම් ඃ-

(i) අධ්‍යාපන සුදුසුකම්, පළපුරුද්ද හා වෙනත් සුදුසුකම්

| *තනතුර* | *අධ්‍යාපන සුදුසුකම්* | *පළපුරුද්ද හා වෙනත් සුදුසුකම්* |
|---|---|---|
| අධ්‍යක්ෂ (ඉංජිනේරු) | ශ්‍රී ලංකාව හෝ එක්සත් රාජධානිය හෝ ඕස්ට්‍රේලියාව හෝ කැනඩාව හෝ චීනය හෝ ඉන්දියාව හෝ පකිස්ථානය හෝ නවසීලන්තය හෝ මලයාසියාව හෝ සිංගප්පූරුව හෝ දකුණු අප්‍රිකාව හෝ අයර්ලන්තය යන රටවල හෝ අදාළ සහතික පිළිගැනීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව සමඟ ද්විපාර්ශික ගිවිසුම්වලට එළඹ ඇති රටක රාජ්‍ය නාවික පරිපාලන ආයතනයක් විසින් නිකුත් කරනු ලැබූ ප්‍රධාන ඉංජිනේරු ප්‍රවීණතා සහතිකය ලබා තිබීම. | කිලෝවොට් 3000ට වැඩි ධාරිතාවක් ඇති ප්‍රධාන එන්ජිමක් සතු සාගර තරණයෙහි යෙදෙන වෙළඳ නෞකාවක ප්‍රධාන ඉංජිනේරුවකු වශයෙන් අවුරුදු 02 ක අවම පළපුරුද්දක් ලබා තිබීම. |

(ii) කායික සුදුසුකම්
සෑම අපේක්ෂකයෙකු ම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරෙහි රාජකාරී ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

(iii) වයස් සීමාව
ඉල්ලුම්කරුවන් ඉල්ලුම් පත්‍ර භාර ගැනීමේ අවසාන දිනට වයස අවුරුදු 30ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 45ට නොවැඩි විය යුතුය.

දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු අයට වයස් සීමාව බල නොපානු ඇත.

(iv) වෙනත් සුදුසුකම්

- ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.
- අයදුම්කරු විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

**සටහන** ඃ- අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට අයදුම්කරුවන් විසින් ඉහත සියලු සුදුසුකම් සෑම ආකාරයකින් ම සම්පූර්ණ කර තිබිය යුතුය.

3. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි හා සේවා කොන්දේසිඃ-

(i) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයට ඔබ යටත් විය යුතුවේ. ඔබ වැන්දඹු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතු අතර රජය මඟින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතුය.
(ii) මෙම පත්වීම අවුරුදු 03 ක පරිවාස කාලයකට යටත්ය. මෙම තනතුරෙහි I වැනි ශ්‍රේණියට බඳවාගෙන වසර 05 ක් ඇතුළත බඳවා ගැනීමේ පරිපාටියේ සඳහන් ආකාරයට පළමු වැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතුය.
(iii) 2020.10.16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 හි සඳහන් විධිවිධාන අනුව අදාළ රාජ්‍ය භාෂාවේ/භාෂාවන්හි ප්‍රවීණතාවය ලබා ගත යුතුය.
(iv) මෙම පත්වීම රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති වලට ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද, රජයේ මුදල් රෙගුලාසිවලට ද, දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝග හා වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යාංශයේ වෙළඳ නාවික ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂ (ඉංජිනේරු) තනතුරට අදාළ බඳවා ගැනීමේ පරිපාටියට දැනටමත් කර ඇත්තා වූද, මතුවට කරනු ලබන්නා වූද, සංශෝධනයන්ට හා විධිවිධානයන්ට යටත් වේ.

(v) අයදුම් කරන භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ ලබා නොදෙන අතර, අයදුම්පත්‍රයේ සඳහන් කරනු ලබන භාෂා මාධ්‍යය පත්වීම් ලැබීමට සුදුසුකම් ලබන භාෂා මාධ්‍යය වේ.

4. වැටුප් පරිමාණය :

මෙම තනතුරට රු.47,615 -10 x 1,335 - 8 x 1,630 - 17 x 2,170 - රු. 110,895 ක (මාසික) වැටුප් පරිමාණයක් හිමි වන අතර මෙහි 20 වන පියවරෙහි (රු.76,175) තබා වැටුප් ගෙවනු ලැබේ. (මීට අමතරව රු. 80,000 ක වෘත්තීය දීමනාවක් ඇතුලු රජය විසින් අනුමත අනෙකුත් දීමනා හා වරප්‍රසාද මෙම තනතුරට හිමිය.)

5. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා පහත සඳහන් ලකුණු පටිපාටිය පදනම් කරගනු ලැබේ.

| අනු අංකය | විෂය | ලකුණු | උපරිම ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| 01 | අතිරේක අධ්‍යාපන සුදුසුකම :<br>i. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින්/ආයතනයකින් ලබා ගත් සාමුද්‍රික ඉංජිනේරු විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධියක් සඳහා<br>ii. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින්/ආයතනයකින් ලබා ගත් සාමුද්‍රික ඉංජිනේරු විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් සඳහා<br>iii. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින්/ආයතනයකින් ලබා ගත් සමුද්‍රික ඉංජිනේරු විද්‍යාව, ඉංජිනේරු විද්‍යාව, හෝ නාවුක විද්‍යාව පිළිබඳ උපාධියක් සඳහා<br>(උපරිම සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබාදෙනු ලැබේ.) | 30<br>20<br>15 | 30 |
| 02. | වෘත්තීය සුදුසුකම්<br>සමුද්‍රීය සෝදිසි කිරීම, නැව් ලියාපදිංචි කිරීම, සාමුද්‍රික නීතිය, සාමුද්‍රීය පරීක්ෂණ හා විමර්ශන හෝ නාවික කටයුතු ආරක්ෂාව සහ සුරක්ෂිතතාවය පිළිබඳ ජාත්‍යන්තර ප්‍රමිතීන් යන ක්ෂේත්‍රයන්ට අදාළව රජය පිළිගත් ආයතනයකින් ලබාගත්<br>i. මාස 06 ක හෝ ඊට වැඩි පූර්ණ කාලීන හෝ ඊට සමාන අධ්‍යයන කාලයක් සහිත පාඨමාලා<br>ii. මාස 03 ක් හෝ ඊට වැඩි හා මාස 06 ට අඩු පූර්ණ කාලීන හෝ ඊට සමාන අධ්‍යයන කාලයක් සහිත පාඨමාලා<br>iii. මාස 03 ට අඩු පූර්ණ කාලීන හෝ ඊට සමාන අධ්‍යයන කාලයක් සහිත පාඨමාලා<br>(උපරිම සහතික 02 ක් සඳහා ලකුණු ලබා දිය හැක.) | 10<br>07<br>03 | 10 |
| 03. | අතිරේක පළපුරුද්ද<br>i. රාජ්‍ය නාවික පරිපාලන ආයතනයක විධායක හෝ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමක තනතුරක සේවය කර තිබීම.<br>- එක් වසරකට ලකුණු 04 බැගින් උපරිමය වසර 05ක් සඳහා<br>- මාස 06 ට වැඩි හා අවුරුද්දකට අඩු : ලකුණු 02<br>ii. බඳවා ගැනීමේ සුදුසුකම් යටතේ සඳහන් අවම පළපුරුද්ද ඉක්මවූ පළපුරුදු කාලසීමාව වෙනුවෙන්<br>- එක් වසරකට ලකුණු 02 බැගින් උපරිමය වසර 05ක් සඳහා<br>- මාස 06ට වැඩි හා අවුරුද්දකට අඩු : ලකුණු 01 | 20<br>10 | 30 |
| 04 | ක්ෂේත්‍රය සඳහා දායකත්වය<br>ක්ෂේත්‍රයට අදාළව ජාතික හෝ ජාත්‍යන්තරව පිළිගත් ශාස්ත්‍රීය සංග්‍රහයක පළ වූ පත්‍රිකාවක් හෝ පේටන්ට් අයිතිය සහිත නව සොයා ගැනීම් විධිමත්/පිළිගත් අනුමැතියන් හෝ සහතික ඉදිරිපත් කළ යුතුය | 10 | 10 |

| අනු අංකය | විෂය | ලකුණු | උපරිම ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| 05 | පරිගණක හැකියාව<br>සාමුද්‍රික ඉංජිනේරු විද්‍යාව, නෞකා යාත්‍රණ හෝ පරිගණක ආශ්‍රිත පුහුණු කිරීම් හා පරීක්ෂණ පැවැත්වීම යන ක්ෂේත්‍රයන්ට අදාළ තොරතුරු තාක්ෂණය/පරිගණක පද්ධති/ පරිගණක යෙදුම් පිළිබඳව රජය පිළිගත් ආයතනයකින් ලබාගත්<br>i. මාස 06 ක හෝ ඊට වැඩි පූර්ණ කාලීන හෝ ඊට සමාන අධ්‍යයන කාලයක් සහිත පාඨමාලා<br>ii. මාස 03 ක හෝ ඊට වැඩි හා මාස 06 ට අඩු පූර්ණ කාලීන හෝ ඊට සමාන අධ්‍යයන කාලයක් සහිත පාඨමාලා<br>iii. මාස 03 ට අඩු පූර්ණ කාලීන හෝ ඊට සමාන අධ්‍යයන කාලයක් සහිත පාඨමාලා (උපරිම සහතික 02 ක් සඳහා ලකුණු ලබා දිය හැක) | <br><br>15<br><br>10<br><br>03 | 15 |
| 06 | සම්මුඛ පරීක්ෂණයේ දී පෙන්වනු ලබන කුසලතාවය සඳහා | | 05 |
| | එකතුව | | 100 |

6. අපේක්ෂකයන්ගේ අනන්‍යතාවය :-

(i) ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන්නේ සෑම ආකාරයකින් ම සම්පූර්ණ කරන ලද අයදුම්පත් ඉදිරිපත් කර ඇති අපේක්ෂකයින් පමණි.

(ii) සම්මුඛ පරීක්ෂණයේ දී සියලුම සහතික වල මුල් පිටපත් හා නිසි පරිදි සහතික කරන ලද ඡායා පිටපත් ඉදිරිපත් කළ යුතුය.

(iii) සම්මුඛ පරීක්ෂණයේ දී තමන්ගේ අනන්‍යතාවය සහතික කිරීම සඳහා පහත සඳහන් අනන්‍යතා පත්‍ර පිළිගනු ලැබේ.

(a) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද වලංගු ජාතික හැඳුනුම්පත
(b) වලංගු විදේශ ගමන් බලපත්‍රය

7. අයදුම්පත් ඉදිරිපත් කිරීම :-

(i) අයදුම්පත් **2022 ඔක්තෝබර් 01** වැනි දිනට හෝ ඊට ප්‍රථම පහත සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කළ යුතු වේ. එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

වෙළඳ නැව් අධ්‍යක්ෂ ජනරාල්,
වෙළඳ නාවික ලේකම් කාර්යාලය,
අංක 43/89, බ්‍රිස්ටල් ගොඩනැගිල්ල,
1 වන මහල, යෝර්ක් වීදිය, කොළඹ 01.

(ii) ඉදිරිපත් කළ යුතු අයදුම්පත්‍රයේ ආදර්ශ ආකෘති පත්‍රයක් මෙම නිවේදනය අවසානයේ දැක්වේ. අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත් A4 ප්‍රමාණයේ කඩදාසියක සකස් කර මුල් පිටුව අංක 01 සිට 09 දක්වාත් දෙවැනි පිටුව අංක 10 සිට 15 දක්වාත්, වන ආකාරයෙන් පිළියෙල කර තමාගේ අත් අකුරින් සම්පූර්ණ කළ යුතුය.

(iii) අයදුම්පත බහාලන කවරයේ ඉහළ වම් කෙළවරේ ''අධ්‍යක්ෂ (ඉංජිනේරු) තනතුර සඳහා අයදුම් කිරීම'' යනුවෙන් සඳහන් කළ යුතුය.

(iv) අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ පාසලක විදුහල්පතිවරයෙකු/සාමදාන විනිශ්චයකාරවරයෙකු/දිවුරුම් කොමසාරිස්වරයෙකු/නීතිඥවරයෙකු/ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු/ත්‍රිවිධ හමුදාවේ අධිකාරී ලත් නිලධරයෙකු හෝ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 ට අනුව, රු. 32,807 ක් හෝ ඊට වැඩි මාසික වැටුපක් ලබන රජයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු විසින් සහතික කළ යුතුය.

(v) දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් තම අයදුම්පත්, තමන් සේවය කරන දෙපාර්තමේන්තුවේ දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් ඉදිරිපත් කළ යුතුය.

(vi) මේ සමග ඇති ආදර්ශ අයදුම්පත්‍රයේ ආකෘතියට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් නැතිවීම හෝ ප්‍රමාද වීම ගැන කිසිදු පැමිණිල්ලක් භාර ගනු නොලැබේ.

8. ඔබ විසින් එවන ලද අයදුම්පත්‍රයේ සඳහන් කර ඇති යම් තොරතුරක් අසත්‍ය බව හෝ වැරදි බව බඳවා ගැනීමට ප්‍රථම අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදාළ ක්‍රියා මාර්ගයන්ට යටත්ව සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

9. පුරප්පාඩු පිරවීමේ හෝ නොපිරවීමේ අයිතිය රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

කේ. ඩී. එස්. රුවන්චන්ද්‍ර,
ලේකම්,
වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යාංශය,

2022 අගෝස්තු මස 22 වැනි දින,
වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යාංශය,
අංක 19,
චෛත්‍ය පාර,
කොළඹ 01

**වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යාංශයේ වෙළඳ නාවික ලේකම් කාර්යාලයේ වරාය රාජ්‍ය පාලන නිලධාරී (නැව් තට්ටු) තනතුර සඳහා බඳවා ගැනීම - 2022**

වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යාංශය යටතේ පවත්වාගෙන යනු ලබන වෙළඳ නාවික ලේකම් කාර්යාලයේ වරාය රාජ්‍ය පාලන නිලධාරී (නැව් තට්ටු) තනතුර සඳහා මෙහි දෙවැනි වගන්තියේ සඳහන් සුදුසුකම් සපුරාලන ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| තනතුර | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|
| 01. වරාය රාජ්‍ය පාලන නිලධාරී (නැව් තට්ටු) | 01 |

1. බඳවා ගැනීමේ ක්‍රමය :

මෙම නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් අතරින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත ඉහළම ලකුණු ලබා ගන්නා අපේක්ෂකයා, පුරප්පාඩුව සඳහා බඳවා ගනු ලැබේ. එහිදී යොදා ගනු ලබන රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ ලකුණු දීමේ පටිපාටිය මෙම නිවේදනයේ අංක 05 යටතේ දක්වා ඇත.

2. අවශ්‍ය සුදුසුකම් :

(i) අධ්‍යාපන සුදුසුකම්, පළපුරුද්ද හා වෙනත් සුදුසුකම් -

| තනතුර | අධ්‍යාපන සුදුසුකම් | පළපුරුද්ද හා වෙනත් සුදුසුකම් |
|---|---|---|
| වරාය රාජ්‍ය පාලන නිලධාරී (නැව් තට්ටු) | ශ්‍රී ලංකාව හෝ එක්සත් රාජධානිය හෝ ඕස්ට්‍රේලියාව හෝ කැනඩාව හෝ චීනය හෝ ඉන්දියාව හෝ පකිස්ථානය හෝ නවසීලන්තය හෝ මලයාසියාව හෝ සිංගප්පූරුව හෝ දකුණු අප්‍රිකාව හෝ අයර්ලන්තය යන රටවල හෝ අදාළ සහතික පිළිගැනීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව සමග ද්විපාර්ශික ගිවිසුම්වලට එළඹ ඇති රටක රාජ්‍ය නාවික පරිපාලන ආයතනයක් විසින් නිකුත් කරනු ලැබූ ප්‍රධාන නැව්පති ප්‍රවීණතා සහතිකය ලබා තිබීම. | තනි බර ටොන් 3000ක හෝ ඊට වැඩි සාගර/සමුද්‍රීය තරණයෙහි යෙදෙන වෙළඳ නෞකාවක නැව්පති වශයෙන් අවුරුදු 02 ක අවම පළපුරුද්දක් තිබීම. |

(ii) කායික සුදුසුකම්-
සෑම අපේක්ෂකයෙකු ම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරෙහි රාජකාරී ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

(iii) වයස් සීමාව-
ඉල්ලුම්කරුවන් ඉල්ලුම් පත්‍ර භාර ගැනීමේ අවසාන දිනට වයස අවුරුදු 30ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 45ට නොවැඩි විය යුතුය.

දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු අයට වයස් සීමාව බල නොපානු ඇත.

(iv) වෙනත් සුදුසුකම්-

- ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.
- අයදුම්කරු විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

***සටහන*** :-අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට අයදුම්කරුවන් විසින් ඉහත සියලු සුදුසුකම් සෑම ආකාරයකින් ම සම්පූර්ණ කර තිබිය යුතුය.

3. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි හා සේවා කොන්දේසිඃ-

(i) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට ඔබ යටත් විය යුතුවේ. ඔබ වැන්දඹු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතු අතර රජය මගින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතුය.
(ii) මෙම පත්වීම අවුරුදු 03 ක පරිවාස කාලයකට යටත්ය. මෙම තනතුරෙහි I වැනි ශ්‍රේණියට බඳවාගෙන වසර 05 ක් ඇතුළත බඳවා ගැනීමේ පරිපාටියේ සඳහන් ආකාරයට පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතුය.
(iii) 2020.10.16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 හි සඳහන් විධිවිධාන අනුව අදාළ රාජ්‍ය භාෂාවේ/භාෂාවන්හි ප්‍රවීණතාවය ලබා ගත යුතුය.
(iv) මෙම පත්වීම රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති වලට ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද, රජයේ මුදල් රෙගුලාසිවලට ද, දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝග හා වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යාංශයේ වෙළඳ නාවික ලේකම් කාර්යාලයේ වරාය රාජ්‍ය පාලන නිලධාරී (නැව් තට්ටු) තනතුරට අදාළ බඳවා ගැනීමේ පරිපාටියට දැනටමත් කර ඇත්තා වූද, මතුවට කරනු ලබන්නා වූද, සංශෝධනයන්ට හා විධිවිධානයන්ට යටත් වේ.
(v) අයදුම් කරන භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ ලබා නොදෙන අතර, අයදුම්පත්‍රයේ සඳහන් කරනු ලබන භාෂා මාධ්‍යය පත්වීම් ලැබීමට සුදුසුකම් ලබන භාෂා මාධ්‍යය වේ.

4. වැටුප් පරිමාණය ඃ

මෙම තනතුරට රු.47,615 -10 x 1,335 - 8 x 1,630 - 17 x 2,170 - රු. 110,895 ක (මාසික) වැටුප් පරිමාණයක් හිමි වන අතර මෙහි 20 වන පියවරෙහි (රු.76,175) තබා වැටුප් ගෙවනු ලැබේ. (මීට අමතරව රු. 80,000 ක වෘත්තීය දීමනාවක් ඇතුලු රජය විසින් අනුමත අනෙකුත් දීමනා හා වරප්‍රසාද මෙම තනතුරට හිමිය.)

5. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා පහත සඳහන් ලකුණු පටිපාටිය පදනම් කරගනු ලැබේ.

| අනු අංකය | විෂය | ලකුණු | උපරිම ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| 01 | අතිරේක අධ්‍යාපන සුදුසුකම<br>i. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින්/ආයතනයකින් ලබා ගත් නාවුක විද්‍යාව, සමුද්‍රික ඉංජිනේරු විද්‍යාව, නෞකා යාත්‍රණ හා සාමුද්‍රීය විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධියක් සඳහා<br>ii. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින්/ආයතනයකින් ලබා ගත් සමුද්‍රික ඉංජිනේරු විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් සඳහා<br>iii. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින්/ආයතනයකින් ලබා ගත් සමුද්‍රික ඉංජිනේරු විද්‍යාව, ඉංජිනේරු විද්‍යාව, නාවුක විද්‍යාව නෞකා යාත්‍රණ හෝ සාමුද්‍රීය විද්‍යාව පිළිබඳ උපාධියක් සඳහා<br>(උපරිම සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබාදෙනු ලැබේ.) | 30<br>20<br>15 | 30 |

| අනු අංකය | විෂය | ලකුණු | උපරිම ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| 02. | වෘත්තීය සුදුසුකම්<br>සමුද්‍රීය සෝදිසි කිරීම, නාවික කටයුතු ආරක්ෂාව සහ සුරක්ෂිතතාවය පිළිබඳ ජාත්‍යන්තර ප්‍රමිතීන් යන ක්ෂේත්‍රයන්ට අදාළව රජයේ පිළිගත් ආයතනයකින් ලබාගත්<br>i. මාස 06 ක හෝ ඊට වැඩි පූර්ණ කාලීන හෝ ඊට සමාන අධ්‍යයන කාලයක් සහිත පාඨමාලා<br>ii. මාස 03 ක් හෝ ඊට වැඩි හා මාස 06 ට අඩු පූර්ණ කාලීන හෝ ඊට සමාන අධ්‍යයන කාලයක් සහිත පාඨමාලා<br>iii. මාස 03 ට අඩු පූර්ණ කාලීන හෝ ඊට සමාන අධ්‍යයන කාලයක් සහිත පාඨමාලා<br>(උපරිම සහතික 02 ක් සඳහා ලකුණු ලබා දිය හැක.) | 10<br>07<br>03 | 10 |
| 03. | අතිරේක පළපුරුද්ද<br>i. බඳවා ගැනීමේ සුදුසුකම් යටතේ සඳහන් අවම පළපුරුද්ද ඉක්මවූ පළපුරුදු කාලසීමාව වෙනුවෙන්<br>- එක් වසරකට ලකුණු 05 බැගින් උපරිමය ලකුණු 30ක්<br>- මාස 06ට වැඩි හා අවුරුද්දකට අඩු ෑ ලකුණු 02 | 10 | 30 |
| 04 | ක්ෂේත්‍රය සඳහා දායකත්වය<br>ක්ෂේත්‍රයට අදාළව ජාතික හෝ ජාත්‍යන්තරව පිළිගත් ශාස්ත්‍රීය සංග්‍රහයක පළ වූ පත්‍රිකාවක් හෝ පේටන්ට් අයිතිය සහිත නව සොයා ගැනීම් විධිමත්/පිළිගත් අනුමැතියන් හෝ සහතික ඉදිරිපත් කළ යුතුය | 10 | 10 |
| 05 | පරිගණක හැකියාව<br>නාවුක විද්‍යාව, නෞකා යාත්‍රණ හා සමුද්‍රීය විද්‍යාව ආශ්‍රිත තොරතුරු තාක්ෂණය/පරිගණක පද්ධති, පරිගනක යෙදවුම් පිළිබඳව රජය පිළිගත් ආයතනයකින් ලබාගත්<br>i. මාස 06 ක හෝ ඊට වැඩි පූර්ණ කාලීන හෝ ඊට සමාන අධ්‍යයන කාලයක් සහිත පාඨමාලා<br>ii. මාස 03 ක හෝ ඊට වැඩි හා මාස 06 ට අඩු පූර්ණ කාලීන හෝ ඊට සමාන අධ්‍යයන කාලයක් සහිත පාඨමාලා<br>iii. මාස 03 ට අඩු පූර්ණ කාලීන හෝ ඊට සමාන අධ්‍යයන කාලයක් සහිත පාඨමාලා<br>(උපරිම සහතික 02 ක් සඳහා ලකුණු ලබා දිය හැක) | 15<br>10<br>03 | 15 |
| 06 | සම්මුඛ පරීක්ෂණයේ දී පෙන්වනු ලබන කුසලතාවය සඳහා | | 05 |
| | එකතුව | | 100 |

6. **අපේක්ෂකයන්ගේ අනන්‍යතාවය :-**

i. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන්නේ සෑම ආකාරයකින් ම සම්පූර්ණ කරන ලද අයදුම්පත් ඉදිරිපත් කර ඇති අපේක්ෂකයින් පමණි.

ii. සම්මුඛ පරීක්ෂණයේ දී සියලුම සහතිකවල මුල් පිටපත් හා නිසි පරිදි සහතික කරන ලද ඡායා පිටපත් ඉදිරිපත් කළ යුතුය.

iii. සම්මුඛ පරීක්ෂණයේ දී තමන්ගේ අනන්‍යතාවය සහතික කිරීම සඳහා පහත සඳහන් අනන්‍යතා පත්‍ර පිළිගනු ලැබේ.

(a) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද වලංගු ජාතික හැඳුනුම්පත

(b) වලංගු විදේශ ගමන් බලපත්‍රය

7. **අයදුම්පත් ඉදිරිපත් කිරීම :-**

(i) අයදුම්පත් **2022 ඔක්තෝබර් 01** වැනි දිනට හෝ ඊට ප්‍රථම පහත සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කළ යුතු වේ. එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.
වෙළෙඳ නැව් අධ්‍යක්ෂ ජනරාල්,
වෙළෙඳ නාවික ලේකම් කාර්යාලය,

අංක 43/89, බ්‍රිස්ටල් ගොඩනැගිල්ල,
1 වන මහල, යෝර්ක් වීදිය, කොළඹ 01.

(ii) ඉදිරිපත් කළ යුතු අයදුම්පත්‍රයේ ආදර්ශ ආකෘති පත්‍රයක් මෙම නිවේදනය අවසානයේ දැක්වේ. අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත් A4 ප්‍රමාණයේ කඩදාසියක සකස් කර මුල් පිටුව අංක 01 සිට 09 දක්වාත් දෙවැනි පිටුව අංක 10 සිට 15 දක්වාත්, වන ආකාරයෙන් පිළියෙල කර තමාගේ අත් අකුරින් සම්පූර්ණ කළ යුතුය.

(iii) අයදුම්පත බහාලන කවරයේ ඉහළ වම් කෙළවරේ ''වරාය රාජ්‍ය පාලන නිලධාරි (නැව් තට්ටු) තනතුර සඳහා අයදුම් කිරීම'' යනුවෙන් සඳහන් කළ යුතුය.

(iv) අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ පාසලක විදුහල්පතිවරයෙකු/සාමදාන විනිශ්චයකාරවරයෙකු/දිවුරුම් කොමසාරිස්වරයෙකු/නීතිඥවරයෙකු/ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු/ත්‍රිවිධ හමුදාවේ අධිකාරි ලත් නිලධරයෙකු හෝ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 ට අනුව, රු. 32,807 ක් හෝ ඊට වැඩි මාසික වැටුපක් ලබන රජයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු විසින් සහතික කළ යුතුය.

(v) දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් තම අයදුම්පත්, තමන් සේවය කරන දෙපාර්තමේන්තුවේ දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය.

(vi) මේ සමග ඇති ආදර්ශ අයදුම්පත්‍රයේ ආකෘතියට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් නැතිවීම හෝ ප්‍රමාද වීම ගැන කිසිදු පැමිණිල්ලක් භාර ගනු නොලැබේ.

8. ඔබ විසින් එවන ලද අයදුම්පත්‍රයේ සඳහන් කර ඇති යම් තොරතුරක් අසත්‍ය බව හෝ වැරදි බව බඳවා ගැනීමට ප්‍රථම අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදාළ ක්‍රියා මාර්ගයන්ට යටත්ව සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

9. පුරප්පාඩු පිරවීමේ හෝ නොපිරවීමේ අයිතිය රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

කේ. ඩී. එස්. රුවන්චන්ද්‍ර,
ලේකම්,
වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යාංශය.

2022 අගෝස්තු මස 22 වැනි දින,
වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යාංශය,
අංක 19,
චෛත්‍ය පාර,
කොළඹ 01

**වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යාංශයේ වෙළෙඳ නාවික ලේකම් කාර්යාලයේ වරාය රාජ්‍ය පාලන නිලධාරි (ඉංජිනේරු) තනතුර සඳහා බඳවා ගැනීම - 2022**

වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යාංශය යටතේ පවත්වාගෙන යනු ලබන වෙළඳ නාවික ලේකම් කාර්යාලයේ වරාය රාජ්‍ය පාලන නිලධාරි (ඉංජිනේරු) තනතුරු සඳහා මෙහි දෙවැනි වගන්තියේ සඳහන් සුදුසුකම් සපුරාලන ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| *තනතුර* | *පුරප්පාඩු සංඛ්‍යාව* |
|---|---|
| 02. වරාය රාජ්‍ය පාලන නිලධාරී (ඉංජිනේරු) | 02 |

1. ***බඳවා ගැනීමේ ක්‍රමය :***

මෙම නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් අතරින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත ඉහළම ලකුණු ලබා ගන්නා අපේක්ෂකයින්, පුරප්පාඩු සඳහා බඳවා ගනු ලැබේ. එහිදී යොදා ගනු ලබන රාජ්‍ය සේවා

කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ ලකුණු දීමේ පටිපාටිය මෙම නිවේදනයේ අංක 05 යටතේ දක්වා ඇත.

2. ***අවශ්‍ය සුදුසුකම් :-***

(i) අධ්‍යාපන සුදුසුකම්, පළපුරුද්ද හා වෙනත් සුදුසුකම්

| *තනතුර* | *අධ්‍යාපන සුදුසුකම්* | *පළපුරුද්ද හා වෙනත් සුදුසුකම්* |
|---|---|---|
| වරාය රාජ්‍ය පාලන නිලධාරි (ඉංජිනේරු) | ශ්‍රී ලංකාව හෝ එක්සත් රාජධානිය හෝ ඕස්ට්‍රේලියාව හෝ කැනඩාව හෝ චීනය හෝ ඉන්දියාව හෝ පකිස්ථානය හෝ නවසීලන්තය හෝ මලයාසියාව හෝ සිංගප්පූරුව හෝ දකුණු අප්‍රිකාව හෝ අයර්ලන්තය යන රටවල හෝ අදාළ සහතික පිළිගැනීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව සමග ද්විපාර්ශික ගිවිසුම්වලට එළඹ ඇති රටක රාජ්‍ය නාවික පරිපාලන ආයතනයක් විසින් නිකුත් කරනු ලැබූ ප්‍රධාන ඉංජිනේරු ප්‍රවීණතා සහතිකය ලබා තිබීම. | කිලෝවොට් 3000ට වැඩි ධාරිතාවයක් ඇති ප්‍රධාන එන්ජිමක් සතු සාගර තරණයෙහි යෙදෙන වෙළෙඳ නෞකාවක ප්‍රධාන ඉංජිනේරුවකු වශයෙන් අවුරුදු 02 ක අවම පළපුරුද්දක් තිබීම. |

(ii) කායික සුදුසුකම් :

සෑම අපේක්ෂකයෙකු ම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරෙහි රාජකාරී ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

(iii) වයස් සීමාව

ඉල්ලුම්කරුවන් ඉල්ලුම්පත්‍ර භාර ගැනීමේ අවසාන දිනට වයස අවුරුදු 30ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 45ට නොවැඩි විය යුතුය.

දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු අයට වයස් සීමාව බල නොපානු ඇත.

(iv) වෙනත් සුදුසුකම් :

- ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
- අයදුම්කරු විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

සටහන :- අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට අයදුම්කරුවන් විසින් ඉහත සියලු සුදුසුකම් සෑම ආකාරයකින් ම සම්පූර්ණ කර තිබිය යුතුය.

3. ***සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි හා සේවා කොන්දේසි :-***

(i) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයට ඔබ යටත් විය යුතුවේ. ඔබ වැන්දඹු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතු අතර රජය මගින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතුය.

(ii) මෙම පත්වීම අවුරුදු 03 ක පරිවාස කාලයකට යටත්ය. මෙම තනතුරෙහි I වැනි ශ්‍රේණියට බඳවාගෙන වසර 05 ක් ඇතුළත බඳවා ගැනීමේ පරිපාටියේ සඳහන් ආකාරයට පළමු වැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතුය.

(iii) 2020.10.16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 හි සඳහන් විධිවිධාන අනුව අදාළ රාජ්‍ය භාෂාවේ/භාෂාවන්හි ප්‍රවීණතාවය ලබා ගත යුතුය.

(iv) මෙම පත්වීම රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීති වලට ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද, රජයේ මුදල් රෙගුලාසිවලට ද, දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝග හා වරාය හා නාවික අමාත්‍යාංශයේ වෙළඳ නාවික ලේකම් කාර්යාලයේ වරාය රාජ්‍ය පාලන නිලධාරි (ඉංජිනේරු) තනතුරට අදාළ බඳවා ගැනීමේ පරිපාටියට දැනටමත් කර ඇත්තාවූද, මතුවට කරනු ලබන්නාවූද, සංශෝධනයන්ට හා විධිවිධානයන්ට යටත් වේ.

(v) අයදුම් කරන භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ ලබා නොදෙන අතර, අයදුම්පත්‍රයේ සඳහන් කරනු ලබන භාෂා මාධ්‍යය පත්වීම් ලැබීමට සුදුසුකම් ලබන භාෂා මාධ්‍යය වේ.

4. *වැටුප් පරිමාණය :*

මෙම තනතුරට රු.47,615 -10 x 1,335 - 8 x 1,630 - 17 x 2,170 - රු. 110,895 ක (මාසික) වැටුප් පරිමාණයක් හිමි වන අතර මෙහි 20 වන පියවරෙහි (රු.76,175) තබා වැටුප් ගෙවනු ලැබේ. (මීට අමතරව රු. 80,000 ක වෘත්තීය දීමනාවක් ඇතුලු රජය විසින් අනුමත අනෙකුත් දීමනා හා වරප්‍රසාද මෙම තනතුරට හිමිය.)

5. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා පහත සඳහන් ලකුණු පටිපාටිය පදනම් කරගනු ලැබේ.

| *අනු අංකය* | *විෂය* | *ලකුණු* | *උපරිම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|
| 01 | අතිරේක අධ්‍යාපන සුදුසුකම්<br>i. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින්/ආයතනයකින් ලබා ගත් සමුද්‍රික ඉංජිනේරු විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධියක් සඳහා<br>ii. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින්/ආයතනයකින් ලබා ගත් සමුද්‍රික ඉංජිනේරු විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් සඳහා<br>iii. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින්/ආයතනයකින් ලබා ගත් සමුද්‍රික ඉංජිනේරු විද්‍යාව, ඉංජිනේරු විද්‍යාව, නාවුක විද්‍යාව හෝ සමුද්‍රික විද්‍යාව පිළිබඳ උපාධියක් සඳහා<br>(උපරිම සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබාදෙනු ලැබේ.) | 30<br>20<br>15 | 30 |
| 02 | *වෘත්තීය සුදුසුකම් :*<br>සමුද්‍රීය සෝදිසි කිරීම, සාමුද්‍රික නීතිය හා රෙගුලාසි, සාමුද්‍රීය පරීක්ෂණ හා විමර්ශන හෝ නාවික කටයුතු ආරක්ෂාව සහ සුරක්ෂිතතාවය පිළිබඳ ජාත්‍යන්තර ප්‍රමිතීන් යන ක්ෂේත්‍රයන්ට අදාළව රජයේ පිළිගත් ආයතනයකින් ලබාගත්<br>i. මාස 06 ක හෝ ඊට වැඩි පූර්ණ කාලීන හෝ ඊට සමාන අධ්‍යයන කාලයක් සහිත පාඨමාලා<br>ii. මාස 03 ක් හෝ ඊට වැඩි හා මාස 06 ට අඩු පූර්ණ කාලීන හෝ ඊට සමාන අධ්‍යයන කාලයක් සහිත පාඨමාලා<br>iii. මාස 03 ට අඩු පූර්ණ කාලීන හෝ ඊට සමාන අධ්‍යයන කාලයක් සහිත පාඨමාලා (උපරිම සහතික 02 ක් සඳහා ලකුණු ලබා දිය හැක) | 10<br>07<br>03 | 10 |
| 03 | *අතිරේක පළපුරුද්ද :*<br>1. බඳවා ගැනීමේ සුදුසුකම් යටතේ සඳහන් අවම පළපුරුද්ද ඉක්මවූ පළපුරුදු කාලසීමාව වෙනුවෙන්<br>- එක් වසරකට ලකුණු 05 බැගින් උපරිමය ලකුණු 30 ක්<br>- මාස 06 ට වැඩි හා අවුරුද්දකට අඩු : ලකුණු 02 | 10 | 30 |
| 04 | *ක්ෂේත්‍රය සඳහා දායකත්වය :*<br>ක්ෂේත්‍රයට අදාළව ජාතික හෝ ජාත්‍යන්තරව පිළිගත් ශාස්ත්‍රීය සංග්‍රහයක පළ වූ පත්‍රිකාවක් හෝ පේටන්ට් අයිතිය සහිත නව සොයා ගැනීම් විධිමත්/පිළිගත් අනුමැතියන් හෝ සහතික ඉදිරිපත් කළ යුතුය. | 10 | 10 |
| 05 | *පරිගණක හැකියාව :*<br>සමුද්‍රික ඉංජිනේරු විද්‍යාව, නාවික විද්‍යාව, නෞකා යාන්ත්‍රණ ආශ්‍රිත පරිගණක යෙදවුම්, පරිගණක ආශ්‍රිත පුහුණු කිරීම් හා පරීක්ෂණ පැවැත්වීම යන ක්ෂේත්‍රයන්ට අදාළ තොරතුරු තාක්ෂණය/පරිගණක පද්ධති/පරිගණක යෙදුම් පිළිබඳ රජය පිළිගත් ආයතනයකින් ලබා ගත්<br>i. මාස 06 ක් හෝ ඊට වැඩි පූර්ණ කාලීන හෝ ඊට සමාන අධ්‍යයන කාලයක් සහිත පාඨමාලා<br>ii. මාස 03 ක් හෝ ඊට වැඩි හා මාස 06 ට අඩු පූර්ණ කාලීන හෝ ඊට සමාන අධ්‍යයන කාලයක් සහිත පාඨමාලා<br>iii. මාස 03 ට අඩු පූර්ණ කාලීන හෝ ඊට සමාන අධ්‍යයන කාලයක් සහිත පාඨමාලා (උපරිම සහතික 02 ක් සඳහා ලකුණු ලබා දිය හැක) | 15<br>10<br>03 | 15 |
| 06. | සම්මුඛ පරීක්ෂණයේ දී පෙන්වනු ලබන කුසලතාවය සඳහා | | 05 |
| | එකතුව | | 100 |

6. *අපේක්ෂකයන්ගේ අනන්‍යතාවය :-*

i. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන්නේ සෑම ආකාරයකින් ම සම්පූර්ණ කරන ලද අයදුම්පත් ඉදිරිපත් කර ඇති අපේක්ෂකයින් පමණි.
ii. සම්මුඛ පරීක්ෂණයේ දී සියලුම සහතිකවල මුල් පිටපත් හා නිසි පරිදි සහතික කරන ලද ඡායා පිටපත් ඉදිරිපත් කළ යුතුය.
iii. සම්මුඛ පරීක්ෂණයේ දී තමන්ගේ අනන්‍යතාවය සහතික කිරීම සඳහා පහත සඳහන් අනන්‍යතා පත්‍ර පිළිගනු ලැබේ.

(a) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද වලංගු ජාතික හැඳුනුම්පත
(b) වලංගු විදේශ ගමන් බලපත්‍රය

7. *අයදුම්පත් ඉදිරිපත් කිරීම :-*

(i) අයදුම්පත් **2022 ඔක්තෝබර් 01 වැනි දිනට හෝ ඊට ප්‍රථම** පහත සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කළ යුතු වේ. එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

වෙළෙඳ නැව් අධ්‍යක්ෂ ජනරාල්,
වෙළෙඳ නාවික ලේකම් කාර්යාලය,
අංක 43/89, බ්‍රිස්ටල් ගොඩනැගිල්ල,
1 වන මහල, යෝර්ක් වීදිය, කොළඹ 01.

(ii) ඉදිරිපත් කළ යුතු අයදුම්පත්‍රයේ ආදර්ශ ආකෘති පත්‍රය මෙම නිවේදනය අවසානයේ දක්වේ. අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත් A4 ප්‍රමාණයේ කඩදාසියක සකස් කර මුල් පිටුව අංක 01 සිට 09 දක්වාත් දෙවැනි පිටුව අංක 10 සිට 15 දක්වාත්, වන ආකාරයෙන් පිළියෙල කර තමාගේ අත් අකුරින් සම්පූර්ණ කළ යුතුය.

(iii) අයදුම්පත බහාලන කවරයේ ඉහළ වම් කෙළවරේ ''වරාය රාජ්‍ය පාලන නිලධාරි (ඉංජිනේරු) තනතුර සඳහා අයදුම් කිරීම'' යනුවෙන් සඳහන් කළ යුතුය.

(iv) අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ පාසලක විදුහල්පතිවරයෙකු/සාමදාන විනිශ්චයකාරවරයෙකු/දිවුරුම් කොමසාරිස්වරයෙකු/නීතිඥවරයෙකු/ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු/ත්‍රිවිධ හමුදාවේ අධිකාරි ලත් නිලධරයෙකු හෝ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 ට අනුව, රු. 32,807 ක් හෝ ඊට වැඩි මාසික වැටුපක් ලබන රජයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු විසින් සහතික කළ යුතුය.

(v) දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් තම අයදුම්පත්, තමන් සේවය කරන දෙපාර්තමේන්තුවේ දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය.

(vi) මේ සමග ඇති ආදර්ශ අයදුම්පත්‍රයේ ආකෘතියට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් නැතිවීම හෝ ප්‍රමාද වීම ගැන කිසිදු පැමිණිල්ලක් භාර ගනු නොලැබේ.

8. ඔබ විසින් එවන ලද අයදුම්පත්‍රයේ සඳහන් කර ඇති යම් තොරතුරක් අසත්‍ය බව හෝ වැරදි බව බඳවා ගැනීමට ප්‍රථම අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදාළ ක්‍රියා මාර්ගයන්ට යටත්ව සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

9. පුරප්පාඩු පිරවීමේ හෝ නොපිරවීමේ අයිතිය රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

කේ. ඩී. එස්. රුවන්චන්ද්‍ර,
ලේකම්,
වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යාංශය,

2022 අගෝස්තු මස 22 වැනි දින,
වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යාංශය,
අංක 19,
චෛත්‍ය පාර,
කොළඹ 01.

**වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යාංශයේ වෙළෙඳ නාවික ලේකම් කාර්යාලයේ විභාග පරීක්ෂක (ඉංජිනේරු) තනතුරු සඳහා බඳවා ගැනීම - 2022**

වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යාංශය යටතේ පවත්වාගෙන යනු ලබන වෙළෙඳ නාවික ලේකම් කාර්යාලයේ විභාග පරීක්ෂක (ඉංජිනේරු) තනතුරු සඳහා මෙහි දෙවැනි වගන්තියේ සඳහන් සුදුසුකම් සපුරාලන ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| තනතුර | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|
| 03. විභාග පරීක්ෂක (ඉංජිනේරු) | 02 |

1. *බඳවා ගැනීමේ ක්‍රමය :*

මෙම නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් අතරින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත ඉහළම ලකුණු ලබා ගන්නා අපේක්ෂකයින්, පුරප්පාඩු සංඛ්‍යාව අනුව බඳවා ගනු ලැබේ. එහිදී යොදා ගනු ලබන රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ ලකුණු දීමේ පටිපාටිය මෙම නිවේදනයේ අංක 05 යටතේ දක්වා ඇත.

2. *අවශ්‍ය සුදුසුකම් :-*

(i) අධ්‍යාපන සුදුසුකම්, පළපුරුද්ද හා වෙනත් සුදුසුකම්

| තනතුර | අධ්‍යාපන සුදුසුකම් | පළපුරුද්ද හා වෙනත් සුදුසුකම් |
|---|---|---|
| විභාග පරීක්ෂක (ඉංජිනේරු) | ශ්‍රී ලංකාව හෝ එක්සත් රාජධානිය හෝ ඕස්ට්‍රේලියාව හෝ කැනඩාව හෝ චීනය හෝ ඉන්දියාව හෝ පකිස්ථානය හෝ නවසීලන්තය හෝ මලයාසියාව හෝ සිංගප්පූරුව හෝ දකුණු අප්‍රිකාව හෝ අයර්ලන්තය යන රටවල හෝ අදාළ සහතික පිළිගැනීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව සමග ද්විපාර්ශ්වික ගිවිසුම්වලට එළඹ ඇති රටක රාජ්‍ය නාවික පරිපාලන ආයතනයක් විසින් නිකුත් කරනු ලැබූ ප්‍රධාන ඉංජිනේරු ප්‍රවීණතා සහතිකය ලබා තිබීම. | කිලෝවොට් 3000ට වැඩි ධාරිතාවයක් ඇති ප්‍රධාන එන්ජිමක් සතු සාගර තරණයෙහි යෙදෙන වෙළෙඳ නෞකාවක ප්‍රධාන ඉංජිනේරුවකු වශයෙන් අවුරුදු 02 ක අවම පළපුරුද්දක් තිබීම. |

(ii) *කායික සුදුසුකම් :*
සෑම අපේක්ෂකයෙකු ම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරෙහි රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

(iii) *වයස් සීමාව :*
ඉල්ලුම්කරුවන් ඉල්ලුම් පත්‍ර භාර ගැනීමේ අවසාන දිනට වයස අවුරුදු 30ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 45ට නොවැඩි විය යුතුය.

දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු අයට වයස් සීමාව බල නොපානු ඇත.

(iv) *වෙනත් සුදුසුකම් :*

- ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.
- අයදුම්කරු විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

***සටහන*** :- අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට අයදුම්කරුවන් විසින් ඉහත සියලු සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

3. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි හා සේවා කොන්දේසි :-*

(i) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයට ඔබ යටත් විය යුතුවේ. ඔබ වැන්දඹු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතු අතර රජය මඟින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතුය.

(ii) මෙම පත්වීම අවුරුදු 03 පරිවාස කාලයකට යටත්ය. මෙම තනතුරෙහි I වැනි ශ්‍රේණියට බඳවාගෙන වසර 05 ක් ඇතුළත බඳවා ගැනීමේ පරිපාටියේ සඳහන් ආකාරයට පළමු වැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතුය.

(iii) 2020.10.16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 හි සඳහන් විධිවිධාන අනුව අදාළ රාජ්‍ය භාෂාවේ/භාෂාවන්හි ප්‍රවීණතාවය ලබා ගත යුතුය.

(iv) මෙම පත්වීම රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලටද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද, රජයේ මුදල් රෙගුලාසිවලට ද, දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝග හා වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යාංශයේ වෙළෙඳ නාවික ලේකම් කාර්යාලයේ විභාග පරීක්ෂක (ඉංජිනේරු) තනතුරට අදාළ බඳවා ගැනීම් පරිපාටියට දැනටමත් කර ඇත්තා වූද, මතුවට කරනු ලබන්නා වූද, සංශෝධනයන්ට හා විධිවිධානයන්ට යටත් වේ.

(v) අයදුම් කරන භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ ලබා නොදෙන අතර, අයදුම්පත්‍රයේ සඳහන් කරනු ලබන භාෂා මාධ්‍යය පත්වීම් ලැබීමට සුදුසුකම් ලබන භාෂා මාධ්‍යය වේ.

4. *වැටුප් පරිමාණය* :

මෙම තනතුරට රු.47,615 -10 x 1,335 - 8 x 1,630 - 17 x 2,170 - රු. 110,895 ක (මාසික) වැටුප් පරිමාණයක් හිමි වන අතර මෙහි 20 වන පියවරෙහි (රු.76,175) තබා වැටුප් ගෙවනු ලැබේ. (මීට අමතරව රු. 80,000 ක වෘත්තීය දීමනාවක් ඇතුළු රජය විසින් අනුමත අනෙකුත් දීමනා හා වරප්‍රසාද මෙම තනතුරට හිමිය.)

5. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා පහත සඳහන් ලකුණු පටිපාටිය පදනම් කරගනු ලැබේ.

| අනු. අංකය | විෂයය | ලකුණු | උපරිම ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| 01 | අතිරේක අධ්‍යාපන සුදුසුකම් : | | |
| | i. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින්/ආයතනයකින් ලබා ගත් සමුද්‍රික ඉංජිනේරු විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධියක් සඳහා | 30 | |
| | ii. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින්/ආයතනයකින් ලබා ගත් සමුද්‍රික ඉංජිනේරු විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමක් සඳහා | 20 | 30 |
| | iii. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින්/ආයතනයකින් ලබා ගත් සමුද්‍රික ඉංජිනේරු විද්‍යාව, ඉංජිනේරු විද්‍යාව, නාවුක විද්‍යාව හෝ සාමුද්‍රික විද්‍යාව පිළිබඳ උපාධියක් සඳහා (උපරිම සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබාදෙනු ලැබේ.) | 15 | |
| 02. | වෘත්තීය සුදුසුකම් : සමුද්‍රිය සෝදිසි කිරීම, සාමුද්‍රික නීතිය හා රෙගුලාසි, සාමුද්‍රීය පරීක්ෂණ හා විමර්ශන හෝ නාවික කටයුතු ආරක්ෂාව සහ සුරක්ෂිතතාවය පිළිබඳ ජාත්‍යන්තර ප්‍රමිතීන් යන ක්ෂේත්‍රයන්ට අදාළව රජයේ පිළිගත් ආයතනයකින් ලබාගත් | | |
| | i. මාස 06 ක හෝ ඊට වැඩි පූර්ණ කාලීන හෝ ඊට සමාන අධ්‍යයන කාලයක් සහිත පාඨමාලා | 10 | 10 |
| | ii. මාස 03 ක් හෝ ඊට වැඩි හා මාස 06 ට අඩු පූර්ණ කාලීන හෝ ඊට සමාන අධ්‍යයන කාලයක් සහිත පාඨමාලා | 07 | |
| | iii. මාස 03 ට අඩු පූර්ණ කාලීන හෝ ඊට සමාන අධ්‍යයන කාලයක් සහිත පාඨමාලා (උපරිම සහතික 02 ක් සඳහා ලකුණු ලබා දිය හැක.) | 03 | |
| 03. | අතිරේක පළපුරුද්ද : i. බඳවා ගැනීමේ සුදුසුකම් යටතේ සඳහන් අවම පළපුරුද්ද ඉක්මවූ පළපුරුදු කාලසීමාව වෙනුවෙන් - එක් වසරකට ලකුණු 05 බැගින් උපරිමය ලකුණු 30ක් - මාස 06ට වැඩි හා අවුරුද්දකට අඩු : ලකුණු 02 | 10 | 30 |
| 04 | ක්ෂේත්‍රය සඳහා දායකත්වය ක්ෂේත්‍රයට අදාළව ජාතික හෝ ජාත්‍යන්තරව පිළිගත් ශාස්ත්‍රීය සංග්‍රහයක පළ වූ පත්‍රිකාවක් හෝ පේටන්ට් අයිතිය සහිත නව සොයා ගැනීම් විධිමත්/පිළිගත් අනුමැතියන් හෝ සහතික ඉදිරිපත් කළ යුතුය | 10 | 10 |

| අනු. අංකය | විෂයය | ලකුණු | උපරිම ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| 05 | පරිගණක හැකියාව ඃ<br>සමුද්‍රීය ඉංජිනේරු විද්‍යාව, නෞකා යාත්‍රණ, නාවික විද්‍යාව, සමුද්‍රීය විද්‍යාව හෝ පරිගණක ආශ්‍රිත පුහුණු කිරීම් හා පරීක්ෂණ පැවැත්වීම යන ක්ෂේත්‍රයන්ට අදාළ තොරතුරු තාක්ෂණය/පරිගණක පද්ධති/පරිගණක යෙදුම් පිළිබඳ රජය පිළිගත් ආයතනයකින් ලබාගත්<br>i. මාස 06 ක් හෝ ඊට වැඩි පූර්ණ කාලින හෝ ඊට සමාන අධ්‍යයන කාලයක් සහිත පාඨමාලා<br>ii. මාස 03 ක් හෝ ඊට වැඩි හා මාස 06 ට අඩු පූර්ණ කාලීන හෝ ඊට සමාන අධ්‍යයන කාලයක් සහිත පාඨමාලා<br>iii. මාස 03 ට අඩු පූර්ණ කාලීන හෝ ඊට සමාන අධ්‍යයන කාලයක් සහිත පාඨමාලා (උපරිම සහතික 02 ක් සඳහා ලකුණු ලබා දිය හැක) | <br><br><br>15<br><br>10<br><br>03 | 15 |
| 06 | සම්මුඛ පරීක්ෂණයේ දී පෙන්වනු ලබන කුසලතාවය සඳහා | | 05 |
| | එකතුව | | 100 |

6. අපේක්ෂකයන්ගේ අනන්‍යතාවය ඃ-

(i) ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන්නේ සෑම ආකාරයකින්ම සම්පූර්ණ කරන ලද අයදුම්පත් ඉදිරිපත් කර ඇති අපේක්ෂකයින් පමණි.

(ii) සම්මුඛ පරීක්ෂණයේ දී සියලුම සහතිකවල මුල් පිටපත් හා නිසි පරිදි සහතික කරන ලද ඡායා පිටපත් ඉදිරිපත් කළ යුතුය.

(iii) සම්මුඛ පරීක්ෂණයේ දී තමන්ගේ අනන්‍යතාවය සහතික කිරීම සඳහා පහත සඳහන් අනන්‍යතා පත්‍ර පිළිගනු ලැබේ.

(a) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද වලංගු ජාතික හැඳුනුම්පත,

(b) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

7. අයදුම්පත් ඉදිරිපත් කිරීම ඃ-

(i) අයදුම්පත් 2022 ඔක්තෝබර් 01 වැනි දිනට හෝ ඊට ප්‍රථම පහත සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කළ යුතු වේ. එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

වෙළෙඳ නැව් අධ්‍යක්ෂ ජනරාල්,<br>
වෙළෙඳ නාවික ලේකම් කාර්යාලය,<br>
අංක 43/89, බ්‍රිස්ටල් ගොඩනැගිල්ල,<br>
1 වන මහල, යෝර්ක් වීදිය, කොළඹ 01.

(ii) ඉදිරිපත් කළ යුතු අයදුම්පත්‍රයේ ආදර්ශ ආකෘති පත්‍රයක් මෙම නිවේදනය අවසානයේ දැක්වේ. අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත් A4 ප්‍රමාණයේ කඩදාසියක සකස් කර මුල් පිටුව අංක 01 සිට 09 දක්වාත් දෙවැනි පිටුව අංක 10 සිට 15 දක්වාත්, වන ආකාරයෙන් පිළියෙල කර තමාගේ අත් අකුරින් සම්පූර්ණ කළ යුතුය.

(iii) අයදුම්පත බහාලන කවරයේ ඉහළ වම් කෙළවරේ ''විභාග පරීක්ෂක (ඉංජිනේරු) තනතුර සඳහා අයදුම් කිරීම'' යනුවෙන් සඳහන් කළ යුතුය.

(iv) අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ පාසලක විදුහල්පතිවරයෙකු/සාමදාන විනිශ්චයකාරවරයෙකු/දිවුරුම් කොමසාරිස්වරයෙකු/නීතිඥවරයෙකු/ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු/ත්‍රිවිධ හමුදාවේ අධිකාරි ලත් නිලධරයෙකු හෝ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 ට අනුව, රු. 32,807 ක් හෝ ඊට වැඩි මාසික වැටුපක් ලබන රජයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු විසින් සහතික කළ යුතුය.

(v) දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරින් තම අයදුම්පත්, තමන් සේවය කරන දෙපාර්තමේන්තුවේ දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය.

(vi) මේ සමඟ ඇති ආදර්ශ අයදුම්පත්‍රයේ ආකෘතියට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් නැතිවීම හෝ ප්‍රමාද වීම ගැන කිසිදු පැමිණිල්ලක් භාර ගනු නොලැබේ.

8. ඔබ විසින් එවන ලද අයදුම්පත්‍රයේ සඳහන් කර ඇති යම් තොරතුරක් අසත්‍ය බව හෝ වැරදි බව බඳවා ගැනීමට ප්‍රථම අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදාළ ක්‍රියා මාර්ගයන්ට යටත්ව සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

9. පුරප්පාඩු පිරවීමේ හෝ නොපිරවීමේ අයිතිය රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

කේ. ඩී. එස්. රුවන්චන්ද්‍ර,
ලේකම්,
වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යාංශය,

2022 අගෝස්තු මස 22 වැනි දින,
වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යාංශය,
අංක 19,
චෛත්‍ය පාර,
කොළඹ 01.